## පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ 2025.08.20 වන දින පැවැති මහ සභා රැස්වීම් වාර්තාව.

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීම 2025 අගොස්තු මස 20 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපති එම්.ජී.ජ්.ධර්මසිරි මාණිපුර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදී.

ඒ සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් සහභාගී විය.

| | | | |
|---|---|---|---|
| 02. | ගරු ප්‍රාදේශීය සභා උප සභාපති | - | එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා. |
| 03. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.ඩී.ඩබ්.සෝමරත්න මැතිතුමා |
| 04. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.සරත් උෂාන් මහානාම මැතිතුමා. |
| 05. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ඩී.රුවන් චානක පියරත්න මැතිතුමා. |
| 06. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා. |
| 07. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.ඩබ්.නිර්මික දීපාල් අබේවර්ධන මැතිතුමා. |
| 08. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ජී.චන්ද්‍රලාල් මැතිතුමා. |
| 09. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා. |
| 10. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා. |
| 11. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.ඒ.පුෂ්පකුමාර ධනසේකර මැතිතුමා. |
| 12. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා. |
| 13. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ඩබ්.එම්. ශ්‍රියානි වීරසේකර මැතිතුමිය. |
| 14. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා. |
| 15. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ටී.කේ.සම්පත් සිරිශාන්ත මැතිතුමා. |
| 16. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී.එල්.යුරේෂ් පුෂ්පකුමාර මැතිතුමා. |
| 17. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ශාන්ත පුෂ්පකුමාර කුඩාවත්ත මැතිතුමා. |
| 18. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | මයුරි චතුරිකා පරණමාන්න මැතිතුමිය. |
| 19. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.වසන්ත කුමාරසිරි මැතිතුමා. |
| 20. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | රාජේන්ද්‍රන් තිෂෝක් මැතිතුමා. |
| 21. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ජී.ඉන්දික කුමාර මැතිතුමා. |
| 22. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.එම්.ඒ.ඉසුරු සම්පත් අලගියවන්න මැතිතුමා. |
| 23. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.ධනේෂ් කුමරන් මැතිතුමා. |
| 24. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.මොහාන් මංජුල මැතිතුමා. |
| 25. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | බී.තුෂාරි දමයන්ති සිල්වා මැතිතුමිය. |
| 26. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | එච්.ඥානලතා හපුතන්ත්‍රි මැතිතුමිය |
| 27. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | එම්.සුලාරි සඳරේඛා මාකාවිට මැතිතුමිය. |
| 28. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ජී.ඒ.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා. |
| 29. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඉන්දික උදයකුමාර ගුණවර්ධන මැතිතුමා. |
| 30. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා. |
| 31. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.එෆ්.ජගත් සේනාරත්න මැතිතුමා. |
| 32. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා. |
| 33. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ටී. ශ්‍රියානි ජානකී පීරිස් මැතිතුමිය. |
| 34. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | රාජරත්නම් පුවනේස්වරී මැතිතුමිය. |
| 35. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | එම්.ප්‍රදීපා ඉඳුම්ණී කුලරත්න මැතිතුමිය. |
| 36. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ජෙහන් මෝහන් මැතිතුමා. |

පැමිණ සිටි සියලු දෙනාම ආගම සිහි කර , ගරු සභාපතිතුමන් විසින් අද දින මහා සභා රැස්වීම සඳහා පැමිණ සිටින ගරු උප සභාපති තුමා, ගරු විපක්ෂ නායකතුමා ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා ද, ලේකම්තුමා හා නිලධාරීතුමිය ද පිළිගැනීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

**01.පසුගිය සභා වාර්තාව සභා සම්මත කිරීම.(2025.08.06)**

2025.08.06 දින පැවති විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව කියවූවා සේ සළකා සංශෝධන ඇතොත් ඉදිරිපත් කිරීමටත්, සංශෝධන නොමැති නම් එම වාර්තාව සභා සම්මත කිරීමටත් ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

ඒ අනුව 2025.08.06 දින පැවති විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩබ්.එම්. ශ්‍රියානි වීරසේකර මැතිතුමිය විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

02. **සභාපතිවරයා විසින් සභාව වෙත ඉදිරිපත් කළ යුතු නිවේදන.**

සබරගමුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් නිකුත් කර ඇති SGPRPTA/R/A/04/04/I හා 2025.08.13 දිනැති ලිපියට අනුව සබරගමුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය යටතේ පවත්නා පැල්මඩුල්ල බස් නැවතුම්පල පිටුපස පිහිටා ඇති වැසිකිළි පද්ධතිය ගාස්තු අය කිරීමකින් තොරව පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට නඩත්තු කර පවත්වාගෙන යාම සඳහා 2025.08.13 දින සිට පවරා දෙන බවට ලිපිය ගරු සභාවට ඉදිරිපත් කිරීම.

**03.සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා**

අසනීප තත්වයක් හේතුවෙන් සභාවට පැමිණීමට නොහැකි බව දන්වා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එච්.ජී.සචිනි සෙව්වන්දි මැතිතුමියගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා විපක්ෂ නායක ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**04. ගරු සභාව අමතා එවන සංදේශ, මහජන පෙත්සම්/පැමිණිලි සභාව ඉදිරියේ තැබීම.-නැත**

**05.යථා පරිදී කල් දී ඇති ප්‍රශ්න - නැත**

**06.යථා පරිදි කල් දී ඇති යෝජනා**

**I. <u>ගරු සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමාගේ යෝජනා</u>**

**1.1987.අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 12 වන වගන්තිය යටතේ කාරක සභා වෙත බලය පැවරීම.**

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 19 වගන්තිය සමඟ කියවිය යුතු 132 වගන්තිය යටතේ ප්‍රාදේශිය සභාව වෙත පැවරී ඇති බලතල අතුරින් මෙහි පහත උපලේඛනයේ විස්තර කරනු ලබන බලතල එම පනතේ 12 වගන්තිය යටතේ සඳහන් විධිවිධාන අනුව මෙම ප්‍රාදේශිය සභාවේ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව වෙත පවරා දිය යුතු යන්න යෝජනා කරමි.

**උප ලේඛනය**

i. ප්‍රාදේශිය සභාවේ අරමුදලින් කළ හැකි වියදමට අදාළව රු.2,000,000.00 (ලක්ෂ විස්ස) නොයික්මන ප්‍රාග්ධන වියදම් සම්බන්ධයෙන් වන විටදී හා අදාළ වියදම් රු.2,000,000.00 නොයික්මවන පුනරාවර්තන වියදමක් වන විටදී වියදමට අදාළ බලය දීම.
ii. ලක්ෂ 05ක් දක්වා ප්‍රසම්පාදන කටයුත්තකට අදාළව ප්‍රසම්පාදන කමිටුව ලෙස ක්‍රියා කිරීම.
iii. සභාවේ ආදායම් හා වියදම් සමාලෝචනය කර මහ සභාවට නිර්දේශ ලබා දීම.
iv. නව ආදායම් මාර්ග හදුනා ගැනීම හා ඊට අනුයාත කරුණු සම්බන්ධව මහා සභාවට නිර්දේශ කිරීම.
v. වියදම් අවම කිරීම සමබන්ධව මහා සභාවට නිර්දේශ ඉදිරිපත් කිරීම යන කරුණු උදෙසා

- **සභාවේ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව**

1. ගරු ප්‍රාදේශිය සභා සභාපති -එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා
2. ගරු ප්‍රාදේශිය සභා උප සභාපති - එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා
3. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා
4. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - ඒ.ඩබ්.නිර්මික දීපාල් අබේවර්ධන මැතිතුමා
5. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී - මයුරි චතුරිකා පරණමාන්න මැතිතුමිය
6. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී -ටී.කේ.සම්පත් සිරිශාන්ත මැතිතුමා
7. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී -කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා
8. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී -මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා
9. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - ආර්.ධනේෂ් කුමරන් මැතිතුමා
10. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - ඒ.එෆ්.ජගත් සේනාරත්න මැතිතුමා
11. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා
12. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී -ජී.ඒ.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා යන නම් සඳහන් සභිකයන් 12දෙනෙකුගෙන් යුත් මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව පත් කිරීමට යෝජනා කරමි.

- **කාර්මික සේවා කාරක සභාව**

පැල්මඩුල්ල බල ප්‍රදේශයේ භෞතික හා ආර්ථික සංවර්ධනය යටිතල පහසුකම් හා නඩත්තු කටයුතු පිළිබඳව මහ සභාවට නිර්දේශ ලබා දීම හා ඊට අනුයාත කරුණු සම්බන්ධයෙන් මහ සභාවට නිර්දේශ ලබා දීම හා ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් කාර්යයන් ඉටු කිරීම යන කරුණු උදෙසා,

1. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී -ජී.ඒ.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා
2. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී -කේ.ශාන්ත පුෂ්පකුමාර කුඩාවත්ත මැතිතුමා
3. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා
4. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී -ජී.ඉන්දික කුමාර මැතිතුමා
5. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී -ඩී.එල්.යුරේෂ් පුෂ්පකුමාර මැතිතුමා
6. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී -ඒ.එම්.ඒ.ඉසුරු සම්පත් අලගියවන්න මැතිතුමා
7. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී -ඩබ්.මොහාන් මංජුල මැතිතුම
8. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී -ඩබ්.ඉන්දික උදය කමාර ගුණවර්ධන මැතිතුමා
9. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - ආර්.ධනේෂ් කුමරන් මැතිතුමා
10. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - කේ.ඩී.රුවන් චානක පියරත්න මැතිතුමා
11. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී -ටී.ශ්‍රියානි ජානකී පීරිස් මැතිතුමිය
12. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා යන නම් සඳහන් සභිකයන්12 දෙනෙකුගෙන්ද,ප්‍රජා නියෝජිතයින්
13. කාර්මික නිලධාරි - පී.සිරිපාල මයා
14. කාර්මික නිලධාරී -හේමන්ත දංගහදෙණිය මයා දෙදෙනෙකුගෙන් යුත් කාර්මික සේවා කාරක සභාව පත් කිරීමට යෝජනා කරමි.

- **නිවාස හා ප්‍රජා සංවර්ධන කරක සභාව**

පැල්මඩුල්ල ප්‍රාදේශිය සභා සීමාවෙහි නිවාස හා ප්‍රජා සංවර්ධනය පිළිබඳව මහ සභාවට නිර්දේශ ලබා දිමටත් ,සංවර්ධන කටයුතු සඳහා සහ ගරු සභාවේ උන්නතිය, ආදායම් මාර්ග වැඩිදියුණු කිරීම ආදි සියලු සේවාවන් සඳහා උපදේශනය ලබා දීම,ඊට අනුයාත කරුණු සම්බන්ධයෙන් මහ සභාවට නිර්දේශ ලබා දීම ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් කාර්යයන් ඉටු කිරීම යන කරුණු උදෙසා,

1. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී -කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා
2. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී -ඩබ්.එම්.ශ්‍රියානි වීරසේකර මැතිතුමිය
3. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී -කේ.ජී.චන්ද්‍රලාල් ජයරත්න මැතිතුමා
4. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - ඒ.එම්.ඒ.ඉසුරු සම්පත් අලගියවන්න මැතිතුමා
5. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී -ආර්.තිශෝක් මැතිතුමා
6. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - ඩී.එල්.යුරේෂ් පුෂ්පකුමාර මැතිතුමා
7. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනි -එම්.සුලාරි සඳරේඛා මාකාවිට මැතිතුමිය
8. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී -ආර්.පුවනේස්වරී මැතිතුමිය
9. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී -බී.තුෂාරි දමයන්ති සිල්වා මැතිතුමිය

10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී -එච්.එම්.සරත් උෂාන් මහානාම මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී -ඩබ්.ජෙහන් මෝහන් මැතිතුමා යන නම් සඳහන් සභිකයන්12දෙනෙකුගෙන්ද,ප්‍රජා නියෝජිතයින්
13. විශ්‍රාමික නිවාස සංවර්ධන අධිකාරී-ඩබ්.එච්.කේ.ජයවර්ධන මයා
14. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා කණ්ඩායම් කළමනාකරු - ජේ.ඒ.වයි.බුද්ධික ජයකොඩි මයා දෙදෙනෙකුගෙන් යුත් නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාව පත් කිරීමට යෝජනා කරමි.

- **පරිසර හා පොදු පහසුකම් කාරක සභාව**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ මහජනතාවට පොදුවේ බලපානු ලබන සෞඛ්‍ය ගැටලු පිළිබඳ සොයා බැලීම ඒවාට විසඳුම් යෝජනා කිරීම සහ නගරය පිරිසිදු කිරීම් සම්බන්ධව පරීක්ෂා කිරීම හා වාර්තා කිරීම, කෙටේතැන්න ඝන අපද්‍රව්‍ය කළමණාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් පරික්ෂා කිරීම, වැඩි දියුණු කිරීම සඳහා නිර්දේශ ලබා දීම, පාරිසරික සංරක්ෂණ කාර්යයන් හදුනා ගැනීම හා ඒ සඳහා නිර්දේශ මුදල් කාරක සභාවට ඉදිරිපත් කිරීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් කාර්යයන් ඉටු කිරීම යන කරුණු උදෙසා,

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී -ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී -මයුරි චතුරිකා පරණමාන්න මැතිතුමිය
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී -ආර්.තිශෝක් මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී -ඩබ්.වසන්ත කුමාරසිරි මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී -ඩබ්.එම්.ශ්‍රියානි වීරසේකර මැතිතුමිය
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී -එච්.ජී.හපුතන්ත්‍රි මැතිතුමිය
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී -බී.එන්.කේ.බුද්ධාරච්චි මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එෆ්.ජගත් සේනාරත්න මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී -එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.කේ.සම්පත් සිරිශාන්ත මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී -ආර්.ධනේෂ් කුමරන් මැතිතුමා යන නම් සඳහන් සභිකයන් 12 දෙනෙකුගෙන්ද, ප්‍රජා නියෝජිතයින්
13. විශ්‍රාමික මධ්‍යම පරිසර අධිකාරී නිලධාරී -ඩබ්.වී.වික්‍රමසිංහ මයා
14. පරිසරවේදී -ඉන්දික සමරවීර මයා දෙදෙනෙකුගෙන් යුත් නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාව පත් කිරීමට යෝජනා කරමි.

- **උපදේශන කමිටුව**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ විශේෂ කරුණු සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනිම සඳහා ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් කාර්යයන් ඉටු කිරීම යන කරුණු උදෙසා,

1. ගරු උප සභාපති -එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී -ඒ.පී.ජගත් සේනාරත්න මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී -ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී -කේ.ශාන්ත පුෂ්පකුමාර කුඩාවත්ත මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී -ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී -ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී -මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා
9. ඉංජිනේරු -කිත්සිරි තුෂාන් මයා
10. මුල්‍ය කළමනාකාරිණී -ආර්.එම්.රංජනී සිරිසේන මිය
11. බැංකු නිලධාරී -ජානක ගුණරත්න මයා
12. ඉංජිනේරු -රංජිත් කරුණාතිලක මයා
13. -ඇන්ටනී මහතා
14. ගුරු -එම්.නිශාන්ත ලේකම්ගේ මයා යුත් උපදේශන කාරක සභාව පත් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ප්‍රාදේශීය සභාවේ අරමුදලින් කළ හැකි වියදමට අදාළව රු.2,000,000.00 (ලක්ෂ විස්ස) නොයික්මන ප්‍රාග්ධන වියදම් සම්බන්ධයෙන් වන විටදී හා අදාළ වියදම් රු.2,000,000.00 නොයික්මවන පුනරාවර්තන වියදමක් වන විටදී වියදමට අදාළ බලය දීම සඳහා වන යෝජනාව සම්බන්ධයෙන් අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා විපක්ෂනායක ඒ .ඩී.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසා සිටියේ රු.1,000,000.00ක මුදලක් ප්‍රමාණවත් බවයි.

ගරු ප්‍රාදේශීය සභා විපක්ෂනායක ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමාගේ යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් 2025.08.06 දින පැවැති විශේෂ මහ සභා වාර්තාවේ මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ 12 දෙනාට අමතරව බාහිර සාමාජිකයින් දෙදෙනෙකු ඇතුලත් කරන ලෙස ගරු සභික මණ්ඩලයේ 09 දෙනෙකුගේ අත්සනින් යුතු සංශෝධනයක් කිරීමට යෝජනාවක් ගෙන එන ලදි.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා උප සභාපති එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා විසින් තවත් එක් සාමාජිකයෙකු ඇතුලත් කර ගැනීමට යෝජනා කරන ලදි.

එබැවින් මෙම මුදල් හා ප්‍රතිපත්ති කමිටුව සඳහා සභිකවරුන් 12 දෙනෙකු හා බාහිර සමාජිකයන්03 දෙනෙකුගෙන් යුතු මුදල් හා ප්‍රතිපත්ති කමිටුව සඳහා වූ යෝජනා ගරු ප්‍රාදේශීය සභා විපක්ෂනායක ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 01**

ප්‍රාදේශීය සභාවේ අරමුදලින් කළ හැකි වියදමට අදාළව රු.1,000,000.00 (ලක්ෂ දහය) නොයික්මන ප්‍රාග්ධන වියදම් සම්බන්ධයෙන් වන විටදී හා අදාළ වියදම් රු.1,000,000.00 නොයික්මවන පුනරාවර්තන වියදමක් වන විටදී වියදමට අදාළ බලය දීම සඳහා වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව සඳහා,**

1. ගරු ප්‍රාදේශීය සභා සභාපති -එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා උප සභාපති - එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.ඩබ්.නිර්මික දීපාල් අබේවර්ධන මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - මයුරි චතුරිකා පරණමාන්න මැතිතුමිය
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී -ටී.කේ.සම්පත් සිරිශාන්ත මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී -කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී -මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ධනේෂ් කුමරන් මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එෆ්.ජගත් සේනාරත්න මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.ඒ.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා යන නම් සඳහන් සභිකයන් 12දෙනෙකුගෙන් හා
13. විශ්‍රාමික පරිපාලන නිලධාරී -ආර්.එම්.රංජනී සිරිසේන මිය
14. මූල්‍ය කළමණාකරු -ජානක කුලරත්න මයා
15. ස.ජ.බ.පැල්මඩුල්ල සංවිධායක -ටී.යූ.කේ.රූපසිංහ මයා යන නම් සඳහන් බාහිර සාමාජිකයින් 03 දෙනෙකුගෙන් යුත් සංශෝධිත කාරක සභා යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**02.ප්‍රාදේශීය සභා පනතේ 216 වගන්තිය යටතේ අධිකාරිය පිරිනැමීම.**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 132 වගන්තිය යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ අරමුදලින් කළ හැකි වියදමකට අදාළව වියදම රු.50,000.00 නොයික්මවන ප්‍රාග්ධන වියදම් සම්බන්ධයෙන් වන විටදී හා අදාළ වියදම් රු.50,000.00 නොයික්මවන පුනරාවර්තන වියදමක් වන විටදී වියදමට අදාළ බලය දිම සඳහා පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ පොදු පරිපාලනයට යටත්ව 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 216 වන වගන්තිය යටතේ පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් වෙත අධිකාරය පැවරිය යුතු බවටත්, තවද එකී අධිකාරය මෙම යෝජනාවට අදාළ සභාවේ සම්මුතිය මෙම ප්‍රාදේශීය සභාව විසින් පරිච්චින්න කරන තාක් වලංගු විය යුතු බවටත් සභාවට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 02**

ඉහත යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**03. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 216 වගන්තිය සමඟ කියවිය යුතු 78 වගන්තිය යටතේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හා මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් ප්‍රාදේශීය සභාවේ නිලධාරීන් ලෙස පොදු අධිකාරිය දීම.**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 78 වගන්තිය යටතේ සඳහන් වන පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මහජන සෞඛ්‍යට අදාළව ප්‍රරෝහණය හා ආරක්ෂාව කිරීමේ කාර්යය සඳහා පැල්මඩුල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශයට අදාළව පැල්මඩුල්ල වෛද්‍ය නිලධාරී හා එම වෛද්‍ය නිලධාරී යටතේ පාලනය වන සියලුම මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ කාර්යය මණ්ඩලය සේ පිළිගත යුතු බවටත්,ඒ අනුව පැල්මඩුල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය අංශයේ ප්‍රධානියා විය යුතු බවටත්, 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 216 වගන්තියේ විධිවිධාන අනුව සභාපතිවරුන්ගේ පොදු පරිපාලනයට යටත්ව පොදු අධිකාරිය දිය යුතුය යන්න සභාවට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඒ.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 03**

ඉහත යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**04. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 100 වගන්තිය යටතේ බලය පැවරීම**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 78 වන වගන්තිය යටතේ සඳහන් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මහජන සෞඛ්‍යයට අදාළව ප්‍රරෝහණය හා ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ සඳහන් විධිවිධානයන්ට හෝ වෙනත් කවර හෝ ලිඛිත නීතියක් යටතේ සඳහන් විධිවිධානයන්ට පටහැනිව හෝ නොසලකා හැර කටයුතු කිරීමෙන් කිසියම් පීඩාවක් වන ආකාරයට කටයුතු යෙදී තිබේද යන්න පරීක්ෂා කිරීම සඳහා දවසේ සාධාරණ වේලාවක් තුළ කිසියම් වූ පරිශ්‍රයකට ඇතුල්වී පරීක්ෂා කිරීම සඳහා වන කාර්යය මෙහි පහත උපලේඛනයේ සඳහන් සභාවේ නිලධාරීන් වෙත එක්ව හෝ වෙන් වෙන්ව ක්‍රියාත්මක කිරීමට හැකිවන පරිදි 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 216 වන වගන්තිය සමඟ කියවිය යුතු 100 වන වගන්තයේ විධිවිධාන අනුව සභාපතිවරයාගේ පොදු පරිපාලනයට යටත්ව අධිකාරිය දිය යුතුය යන්න සභාවට යෝජනා කරමි.

ඉහත කී උපලේඛනය

1.කාර්මික නිලධාරී - බී.එම්.එස්.අයි.යෝගරත්න මයා
- එච්.ජයසිංහ මයා

- වෛද්‍ය ජේ.එස්.අනුරසිරි මයා
2.මහජන සෞඛ්‍ය පරීක්ෂක - ජී.ටී.ඕ.වසන්ත මයා
ටී.ඒ.යූ.අයි.එස්.එදිරිසිංහ මයා
කේ.පී.අයි.ජයශංඛ මයා
කේ.ජී.එල්.කේ.බණ්ඩාර මයා
එල්.ආර්.සතරසිංහ මයා
ඩබ්.ඒ.පී.එස්.වීරසිංහ මයා
එන්.පී.ජේ.එස්.පෙරේරා මයා

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඉන්දික කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 04</u>**

ඉහත යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.** 2025 මැයි මස 30වන දින අංක 2438/63 අති විශේෂ ගැසට් පත්‍රයේ වගන්තියෙහි සඳහන් පරිදි ප්‍රාදේශීය සභාවක රැස්වීම්වලට සහභාගී වීම වෙනුවෙන් සභාපති, උපසභාපති හා සභිකවරුන්ට මාසිකව ගෙවිය යුතු යැපීම් දීමනා,ගමන් වියදම් දීමනාවල එකතුව උපරිමය රු.8000.00කට යටත්ව පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ වාර්ෂික අයවැය ලේඛනයේ ආදායම් සැළකිල්ලට ගනිමින් අදාළ දීමනාව තීරණය කරන ලෙස යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.වසන්ත කුමාරසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 05</u>**

ඉහත යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**06.** 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 133 වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභා අරමුදලින් කරනු ලබන සියලු ගෙවීම් සඳහා වූ චෙක්පත් හෝ අණකර අත්සන් කිරීමේ පළමු අත්සන්කරු වශයෙන් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් ආර්.කේ.කපිල ජගත් ගුණතිලක මහතාටත් දෙවන අත්සන්කරුවන් වශයෙන් ප්‍රධාන කළමණාකරණ සේවා නිලධාරී ජේ.එම්.එස්.කේ. බණ්ඩාර මහතා හා සංවර්ධන නිලධාරී එස්.රත්නාවතී මැණිකේ මෙය වෙතත් බලය පැවරීම සුදුසු බව යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.පුෂ්පකුමාර ධනසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 06</u>**

ඉහත යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**07.**මාගේ පෞද්ගලික ලේකම් තනතුර සඳහා නො.21, සිරිපාගම, ශ්‍රී පලාබද්දල, රත්නපුර ලිපිනයේ පදිංචි පී.ජී.ආර්.මනෝජ් චන්දික සම්පත් මහතා පත් කිරීමටත්,ප.පා.කො. චක්‍රලේඛ CLG/LG/2/16/2019 ප්‍රකාරව රු.15,000.00ක මුදල ගෙවීමටත්,

එම මුදලින් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තයින්ගේ භාර අරමුදලට අදාළ දායක මුදල් අය කිරීමටත් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී
.

**<u>තීරණ අංක 07</u>**

ඉහත යෝජනාවට අනුව පී.ජී.ආර්.මනෝජ් චන්දික සම්පත් මහතා තාවකාලික ලෙස පෞද්ගලික ලේකම් තනතුරෙහි පිහිටුවීම ඒකමතිකව සභා සම්මත විය.

**08.**මා හට රාජකාරී සඳහා ලබා දී ඇති PF 7484 අංක දරණ කැබ් රථය සඳහා මසකට ඉන්ධන ලීටර 500ක් ලබා දීමටත්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99(IV)-2004 හි සඳහන් පරිදි කි.මී.1000ක සීමාව රු.350.00කට යටත්ව නිල වාහනය පෞද්ගලික පාවිච්චිය සඳහා යොදා ගැනීම සුදුසු බව යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා විපක්ෂ නායක ඒ.ඩී.ඩබ්.සෝමරත්න මැතිතුමා ප්‍රකාශ කර සිටියේ ඉන්ධන ලීටර 300 ලබා දීම සුදුසු බවයි.

ගරු සභාපති තුමා අදහස් දක්වමින් ප්‍රකාශ කර සිටියේ ඉදිරියේදී අවශ්‍යතා මත ඉන්ධන ලීටර 500 ඉක්මවා යා හැකි බවත්,සමහර මාස වල අවශ්‍යතාවය මත ඉතාම අඩු ඉන්ධන ප්‍රමාණයක් වැය විය හැකි බවයි.තවද ප්‍රතිපත්තියක් මත මෙම ඉන්ධන ලීටර 500ට අඩුවෙන් පවත්වාගෙන යාම උත්සහයක් දරන බව පවසන ලදි.

**<u>තීරණ අංක 08</u>**

ගරු සභාපතිතුමාගේ පැහැදිලි කිරීම් හමුවේ ඇති PF 7484 අංක දරණ කැබ් රථය සඳහා මසකට ඉන්ධන ලීටර 500ක් ලබා දීමටත්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99(IV)-2004 හි සඳහන් පරිදි කි.මී.1000ක සීමාව රු.350.00කට යටත්ව නිල වාහනය පෞද්ගලික පාවිච්චිය සඳහා යොදා ගැනීම සුදුසු බව යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**09.**පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මහජන නියෝජිතයින් සඳහා 2025 ජූනි, ජූලි මස දීමනා ගෙවීම අනුමත කිරීමට යෝජනා කරමි.
ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඒ.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී

<u>**තීරණ අංක 09**</u>

ඉහත යෝජනාව අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**10.** පළාත් පාලන ආයතන වල පළාත් පාලන වල මූලික නීතිය පිළිබඳ පුහුණු වැඩසටහන සඳහා සභිකයන් සියලු දෙනාට සහභාගි වීමට හැකි වන පරිදී බස් රථයක් යොදා ගැනීම සඳහා ප්‍රවාහන සේවා ආයතන 03කින් මිල ගණන් කැඳවා ඉන් අඩුම මිල ගණන ඉදිරිපත් කර ඇති ජයන්ත මගී ප්‍රවාහන සේවාව ආවරණ අනුමැතියට යටත්ව ලබා ගැනීම මත රු.25,000.00 මුදල ගෙවීම අනුමැතියට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.වී.නිර්මික දිපාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී

<u>**තීරණ අංක 10**</u>

ඉහත යෝජනාව සළකා බලා රු.25,000.00 මුදල ගෙවීම අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**11.**පැල්මඩුල්ල ගල්ලෙපිට ආදාහනාගාරයේ දැනට භාවිතා කරන ගාස්තුව ලෙස,
බල ප්‍රදේශය තුළ - රු.12,000.00
බල ප්‍රදේශය පිටත - රු.15,000.00 මුදල ඉදිරියටත් අය කිරීම සුදුසු බව යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා විපක්ෂනායක ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී

<u>**තීරණ අංක 11**</u>

ඉහත යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**12.**පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ දෛනිකව දිරන ද්‍රව්‍ය හා සතියකට වරක් නොදිරන ද්‍රව්‍ය ලබා දෙන ව්‍යාපාරික ස්ථාන වලින් පහත පරිදී මුදල් අයකිරීම ගැසට් කිරීම සඳහා යෝජනා කරමි.

| දෛනිකය දිරන කසළ | සතිපතා නොදිරන කසළ | මාසික මුදල |
|---|---|---|
| 10KG-15KG | 5KG-8KG | රු.1000.00 |
| 16KG-21KG | 9KG-12KG | රු.3000.00 |
| 21KGවැඩි ,වැඩිවන සෑම1KGසඳහාම | 13KGවැඩි ,වැඩිවන සෑම1KGසඳහාම | රු.1000.00බැගින් වැඩිවිය යුතුය. |

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා පවසා සිටියේ කසළ යනු ආදායම් මාර්ගයක් බවත්,කසළ පොහොර කර නිසි ප්‍රමිතියකට සකස් කිරීමටත්,ජීව වායුව නිෂ්පාදනය කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා ප්‍රකාශ කර සිටියේ කසළ වලින් නිසි ප්‍රමිතියකට අනුව පොහොර නිපදවීම හා අලෙවිය සඳහා කමිටු හරහා දීර්ඝ ලෙස සාකච්ඡා කර නිසි ක්‍රමවේදයක් සැකසිය යුතු බවයි.

<u>**තීරණ අංක 12**</u>

ඉහත යෝජනාව සළකා බලා මෙම යෝජනාව මුදල් හා ප්‍රතිපත්ති කමිටුවට යොමු කර විධිමත් ක්‍රමවේදය ඔස්සේ මුදල් අය කර ගැනීම සඳහා නිර්දේශ ලබා ගැනීම සුදුසු බව ඒකමතිකව සහා සම්මත විය.

**13.**පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවෙහි පරිසර විෂයෙහි නගර අලංකරණය විෂය පථය යටතේ පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව සතු මහජන පුස්තකාලය පිටුපස මාර්ගය ආසන්නයේ හිස් භූමිය තුළ හරිත උද්‍යානයක් ඉදිකිරීම සම්බන්ධයෙන් සුදුසු තීරණයක් ගැනීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා උප සභාපති එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී

<u>**තීරණ අංක 13**</u>

ඉහත යෝජනාව සළකා බලා මෙම යෝජනාව පරිසර හා පොදු පහසුකම් කමිටුවට යොමු කර නිර්දේශ ලබා ගැනීම සුදුසු බව ඒකමතිකව සහා සම්මත විය.

**14.**පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව වෙත නිරතුරුවම අනතුරුදායක ගස් අයදුම්පත්‍ර ලැබෙන බැවින් සභාව මැදිහත්ව අනතුර ඉවත් කිරීමේදී බාහිරින් ගස් කැපුම්කරුවන් සපයා ගැනීම අසීරු තත්වයක් වී ඇති හෙයින් සභාවට ගස් කැපුම්කරුවෙකු බඳවා ගැනීම සම්බන්ධයෙන් සුදුසු තීරණයක් ගැනීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා උප සභාපති එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 14</u>**

ඉහත යෝජනාව සළකා බලා මෙවැනි තනතුරක් ඇති කිරීමේ හැකියාවක් නොමැති බැවින් ටෙන්ඩර් පටිපාටිය ඔස්සේ මෙම කාර්යය කිරීම සුදුසු බව ඒකමතිකව සහා සම්මත විය.

**15.**පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ කෙටේතැන්න ඉඩම (ගල්උලුවස්සාහේන) මැන නිරවුල් කිරීම සඳහා ජොෂ්ඨ මිනින්දෝරු අධිකාරිගෙ අංක ර/මැ/06/2025/මැ.ගා./2894 හා 2025.07.09 දිනැති ලිපිය හා ප්‍රාදේශිය ලේකම්ගේ PLDS/LND/12/2023/vi හා 2025.07.17 ලිපියට අනුව රු.42,590.00ක මුදල ගෙවීම සඳහා අනුමැතිය ලබා ගැනීමට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.වී.නිර්මික දීපාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී

**<u>තීරණ අංක 15</u>**

ඉහත යෝජනාව සලකා බලා ජොෂ්ඨ මිනින්දෝරු අධිකාරිය වෙත රු.42,590.00ක මැනුම් ගාස්තු ගෙවීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**16.**පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව සතු SG ZA 5173 FOTON වර්ගයේ බැකෝ ලෝඩරය,MODELS R 135 වර්ගයේ ස්කිඩ් ලෝඩරයෙහි අලුත්වැඩියාව සිදු කිරීමටත්,SG RD 5932 STANDARD වර්හයේ ට්‍රැක්ටරය, 49-8876 MASSEY FURGUSON වර්හයේ ට්‍රැක්ටරය වර්හයේ ට්‍රැක්ටරය ඩෙක්මා ආයතනය වෙත යොමු කිරීම සඳහා සුදුසු තීරණය කිරීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත මැතිතුමා විසින් ස්ථිර කරන ලදී

.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශිය සභා විපක්ෂනායක තුමා පවසා සිටියේ අදාල නියෝජිත ආයතන මඟින් අලුත්වැඩියා කිරීමේදී විශාල වියදමක් දැරීමට සිදු වන බවත්,පෞද්ගලික ආයතනයකට යොමු කර අඩු වියදමකින් ඉක්මනින් සිදු කර ගැනීමට හැකි වන බවයි.

**<u>තීරණ අංක 16</u>**

ඉහත යෝජනාව සළකා බලා SG RD 5932 STANDARD වර්ගයේ ට්‍රැක්ටරය, 49-8876 MASSEY FURGUSON වර්ගයේ ට්‍රැක්ටරය ඩෙක්මා අයතනය වෙත යොමු කිරීමටත්, SG ZA 5173 FOTON වර්ගයේ බැකෝ ලෝඩරය,MODELS R 135 වර්ගයේ ස්කිඩ් ලෝඩරය ඇතුලු අලුත්වැඩියා කළ යුතු තත්වයේ පවතින සෙසු වාහන අලුත්වැඩියාව සඳහා නිර්දේශ ලබා ගැනීමට කාර්මික කමිටුවට යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය

**17.**කෙටේතැන්න කසළ කළමණාකරණ මධ්‍යස්ථානයේ මැස්සන් බෝවීම වැළැක්වීම සඳහා මැසි නාශක දියර ලීටර 4 කෑන් 04ක් මිලදී ගැනීම සඳහා සුදුසු තීරණයක් ලබා ගැනීමට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා විපක්ෂනායක ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශිය සභා විපක්ෂනායක තුමා පවසා සිටියේ කසළ කළමණාකරණය විධිමත් කිරීමට නම් වත්තෙන් තව අක්කර 02ක් පමණ වත්තෙන් ලබා ගත හොත් කසළ ගැටලුව විසදිය හැකි බවය.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා පවසා සිටියේ මැස්සන් බෝවීම හා දුර්ගන්ධය ඇතිවන්නේ කසල තෙමීමට ලක්වීම නිසා බවත්,එය වළක්වා ගැනීමට කසළ ගොඩවල් පවතින ස්ථාන වල වහලක් ගැසීම සුදුසු බවයි.

**<u>තීරණ අංක 17</u>**

ඉහත යෝජනාව සළකා බලා විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදය ඔස්සේ මැසි නාශක දියර ලීටර 4 කෑන් 04ක් මිලදී ගැනීම සුදුසු බවටත්,පරිසර කමිටුව හරහා මේ සම්බන්ධව පුළුල් අධ්‍යයනයක් කර ගැඹුරු නිර්දේශ ඉදිරිපත් කර සුදුසු ක්‍රමවේදයක් සකස් කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**18.**ආවරණ අනුමැතියට යටත්ව 2025 වර්ෂය සඳහා වූ පුහුණු සැලැස්මට අනුව 2025.08.07 දින පැවැත්වූ කාර්යාලීය ලිපි හා ගිණුම් ක්‍රම පිළිබඳ ද්විතියික මට්ටමේ නිලධාරීන්ට පැවැත්වීමත්, සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලයේ ප්‍රජා සංවර්ධන නිලධාරී කේ.ඩබ්.එම්.ජී.වීරසිංහ මයාගේ සම්පත් දායකත්වය ලබා ගැනීමත්, ප්‍රධාන ලේකම්ගේ චක්‍රලේඛ අංක - 02/2025 ප්‍රකාරව සම්පත්දායක දීමනා ගෙවීමත්, වැඩ සටහන සඳහා වියදම් කිරිමට සකස් කරන ලද රු,13,000.00 ක දළ ඇස්තමේන්තුවට අනුව ලබා ගත් රු.13,000.00ක ලබා ගත් අත්තිකාරම් මුදල අනුමැතියට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා විපක්ෂ නායක ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 18</u>**

ඉහත යෝජනාව සළකා බලා වැඩ සටහන සඳහා වියදම් කිරිමට සකස් කරන ලද රු,13,000.00 ක දළ ඇස්තමේන්තුවට අනුව ලබා ගත් රු.13,000.00ක ලබා ගත් අත්තිකාරම් මුදල අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**19.**කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ සේවකයින් හට ප්‍රථමාධාර ද්‍රව්‍ය හා සවල් 04, උදළුතල 02, විල්බැරෝ 03, පෙෂර් ගන් 01, ටීපින් අඩි 200, ප්ලාස්ටික් පුටු 06, සෙරන්ඩි 02ක් ලබා දීම සඳහා සුදුසු තීරණ ගැනීමට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා උප සභාපති එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී

**<u>තීරණ අංක 19</u>**

ඉහත යෝජනාව සළකා බලා ප්‍රථමාධාර ද්‍රව්‍ය ලබා ගැනීමටත්, සවල් 04, උදළුතල 02, විල්බැරෝ 03, පෙෂර් ගන් 01, ටීපින් අඩි 200, ප්ලාස්ටික් පුටු 06, සෙරන්ඩි 02ක් විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදය ඔස්සේ මිලදී ගැනීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**20.**කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ ඔෆිස් කාමරයේ හා සේවක විවේකාගාරයේ ඇති අක්‍රිය වී ඇති සිවිලින් ෆෑන් 02 සඳහා නව ෆෑන් 02ක් මිලදී ගැනීම සඳහා සුදුසු තීරණ ගැනීමට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා විපක්ෂනායක ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී

**<u>තීරණ අංක 20</u>**

ඉහත යෝජනාව සළකා බලා මෙම උපකරණ අත්‍යවශ්‍යම බැවින් සිවිලින් ෆෑන් 02 සඳහා නව ෆෑන් 02ක් විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදය ඔස්සේ මිලදී ගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**21.**පැල්මඩුල්ල බල ප්‍රදේශයේ අක්‍රිය වී ඇති වීථි පහන් සම්බන්ධ තොරතුරු අයදුම්පත්‍ර වලට අදාලව වීථි පහන් අලුත්වැඩියා කිරීමේ අවශ්‍යතාවක් පවතින බැවින් ඉදිරිපත් කර ඇති ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා විපක්ෂ නායක ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා ස්ථිර කරන ලදි.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා විපක්ෂ නායක ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසා සිටියේ විථි පහන් සවි කිරීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම සුදුසු බවත්, තමන්ගේ කොට්ඨාශ වල අක්‍රිය වූ වීථි පහන් පමණක් නොව අනෙකුත් වීථි පහන් සැළකිල්ලට ගනිමින් වීථි පහන් ආසන්නයේ ඇති නිවසක දුරකථන අංක ලබා ගැනීමටත්,සියලුම වීථි පහන් අංකනය කිරීමත් සුදුසු බවයි.

**<u>තීරණ අංක 21</u>**

ඒ අනුව පහත සඳහන් අංක 01-13 දක්වා නම් සඳහන් ද්‍රව්‍ය විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදය ඔස්සේ මිලදී ගැනීමටත්,විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීමෙන් පසුව වීථි පහන් අලුත්වැඩියා කටයුතු සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

| අනු අංකය | අවශ්‍ය ද්‍රව්‍ය | ප්‍රමාණය |
|---|---|---|
| 01 | පොට සහිත බල්බ් LED 18W | 500 |
| 02 | ඉග්ලේටර් 400 | 10 |
| 03 | වයර්(1.044)100m | රෝල් 03 |
| 04 | ස්කෘටයිප් හෝල්ඩර් | 50 |
| 05 | වන්ගන් ස්විච් | 50 |
| 06 | අභල් 16 ඇණ | 50 |
| 07 | අභල් 10 ඇණ | 50 |
| 08 | අල්ලු 1 1/2 | 50 |
| 09 | ස්ප්‍රින් වෝර් | 100 |
| 10 | වොෂර්(ප්ලැට්) | 100 |
| 11 | ටේප්රෝල් | 05 |
| 12 | බණ්ඩල් ක්ලිප් | ජෝඩු 100 |
| 13 | බට කප් සෙට් | 100 |

**22.**පැල්මඩුල්ල ප්‍රාදේශිය සභාවේ විදුලි කාර්මිකයන් සඳහා ආරක්ෂක ඉන පටි 01, ආරක්ෂක අත්මේස් ජෝඩු 02, ආයුධ කට්ටල 01 මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඒ.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා උප සභාපති එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා පවසා සිටියේ මොවුන්ගේ ආරක්ෂාව ඉතා වැදගත් බැවින් මෙම උපකරණ ඔවුන්ට ලබා දීම සුදුසු බවයි.

**<u>තීරණ අංක 22</u>**

ඉහත යෝජනාව සලකා බලා විදුලි කාර්මිකයන්ගේ ආරක්ෂාව ඉතා වැදගත් බැවින් විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදය ඔස්සේ සඳහා ආරක්ෂක ඉන පටි 01, ආරක්ෂක අත්මේස් ජෝඩු 02, ආයුධ කට්ටල 01 මිලදී ගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**23.**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2025 ප්‍රකාරව සභාවේ සේවකයින් සඳහා ආපදා සේවක ණය මුදල් ගෙවීම හා මසකට නිශ්චිත මුදලක් තීරණය කිරීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා විපක්ෂ නායක ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම සභාව කාරක සභාවක් බවට පත්කර ලේකම්තුමා වෙත ගරු සභාපතිතුමන් විසින් කරුණු පැහැදිළි කිරීමට අවස්ථාව සලසා දෙන ලදි.රජයෙන් රාජ්‍ය සේවකයින්ට ලැබුණු වරප්‍රසාදයක් බැවින් ගිණුමේ පවතින මුදල් තත්වය සැලකිල්ලට ගනිමින් ආපදා සේවක ණය ලබා දීම සම්බන්ධයෙන් මුදල් හා ප්‍රතිපත්ති කමිටුවට යොමු කිරීම සුදුසු බවයි.

**<u>තීරණ අංක 23</u>**

ඉහත යෝජනාව සලකා බලා සභාවෙහි පවතින මුදල් තත්වය සැලකිල්ලට ගනිමින් සේවක ආපදා ණය ලබා දිම සඳහා මසකට නිශ්චිත මුදලක් තීරණය කිරීම සඳහා මුදල් හා ප්‍රතිපත්ති කමිටුවට යොමු කර නිර්දේශ ලබා ගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**24.**මාරපන පුස්තකාලයට පොත් බැදුම් කට්ටලයක් සහ පැල්මඩුල්ල මහජන පුස්තකාලයට පොත් බැඳීමට බෝඩ් ලබා ගැනිම සඳහා සුදුසු තීරණයක් ලබා ගැනීමට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී

**<u>තීරණ අංක 24</u>**

ඉහත යෝජනාව සළකා බලා විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදය ඔස්සේ .මාරපන පුස්තකාලයට පොත් බැදුම් කට්ටලයක් සහ පැල්මඩුල්ල මහජන පුස්තකාලයට පොත් බැඳීමට බෝඩ් ලබා ගැනීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

25.පාඨක ඉල්ලීම මත සැප්තැම්බර් සාහිත්‍ය මාසය නිමිත්තෙන් පැල්මඩුල්ල, මාරපන,පාතකඩ පුස්තකාල ත්‍රිත්වය සඳහා පොත් මිලදී ගැනිම( අයවැය මඟින් වෙන්කර ඇති මුදල රු.300,000.00) සඳහා තීරණය කිරීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඒ.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී

**<u>තීරණ අංක 25</u>**

ඉහත යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

26.මාරපන උපකාර්යාලයේ TOSHIBA 230gA ෆොටෝකොපි යන්ත්‍රය අලුත්වැඩියාව සඳහා සුදුසු තීරණයක් ගැනීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 26</u>**

ඉහත යෝජනාව සළකා බලා විධිමත් ක්‍රමවේදය ඔස්සේ TOSHIBA 230gA ෆොටෝකොපි යන්ත්‍රය අලුත්වැඩියා කටයුතු සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

27.පාතකඩ මහජන පුස්තකාලයේ පරිගණක යන්ත්‍රය අලුත්වැඩියාව සඳහා සුදුසු තීරණයක් ගැනීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා විපක්ෂනායක ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී

**<u>තීරණ අංක 27</u>**

ඉහත යෝජනාව සළකා බලා සුදුසු ක්‍රමවේදය ඔස්සේ පරිගණකයෙහි අලුත්වැඩියා කටයුතු සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

28.පැල්මඩුල්ල, මාරපන,පාතකඩ පුස්තකාල ත්‍රිත්වය එකතුව පළාත් පාලන සතිය හා සාහිත්‍ය මාසය නිමිත්තෙන් සැප්තැම්බර් මාසයේ සිදු කිරීමට නියමිත වැඩසටහන් වාර්තාව අනුමැතිය ලබා ගැනීමට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා විපක්ෂනායක ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසා සිටියේ මෙම පළාත් පාලන සතිය තුළින් ප්‍රාදේශිය සභාවේ කාර්යයසාධනය ඉහළ නැංවෙන බැවින් ඵලදායි ජනතා සේවයක් ලබා දිය හැකි කාර්යයන් හා ප්‍රාදේශීය සභාවේ පනතේ සඳහන් නීති සම්බන්ධයෙන් දැනුවත් කිරීම්, ක්‍රීඩා තරඟ වැනි දේ මේ පළාත් පාලන සතිය නිමිත්තෙන් කිරීම සුදුසු බවයි.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා පවසා සිටියේ සාහිත්‍ය මාසය නිමිත්තෙන් පොත් රචනා කිරීමට හැකි දරුවන්ගේ නිර්මාණ තෝරාගෙන හොඳම නිර්මාණය මුද්‍රණය කර දීමට හැකියාවක් පවතී නම් එය ඵලදායි බවයි .

**<u>තීරණ අංක 28</u>**

පළාත් පාලන සතිය හා සාහිත්‍ය මාසය නිමිත්තෙන් සැප්තැම්බර් මාසයේ සිදු කිරීමට නියමිත වැඩසටහන් වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

29.ගල්ලෙපිට ආදාහනාගාරයේ නළ ළිඳේ ගිල්වන වතුර මෝටරයට විදුලිය ලබා ගැනීම සඳහා අවශ්‍ය වයිරින් ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එච්.ඥානලතා හපුතන්ත්‍රී මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 29</u>**

ඉහත යෝජනාව සළකා බලා කාර්මික නිලධාරි ලබා දුන් වයිරින් ද්‍රව්‍ය විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදය ඔස්සේ මිලදී ගැනීමටත්,නළ ළිඳ පැවති ස්ථානයට විදුලි සම්බන්ධතාවයක් ලබා ගැනීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

30.පළාත් පාලන සතිය නිමිත්තෙන් 2025 සැප්.15 දින සිට 21 දක්වා වැඩසටහන් "පුනරුදයේ පුරවර" යන තේමාව පාදක කර ගනිමින් පළාත් පාලන සතිය ක්‍රියාත්මක කරමින් එම සතිය තුල කළ යුතු කාර්යයන්, කමිටු හරහා ක්‍රියාත්මක කිරීම සඳහා තීරණයක් ගැනීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 30**

ඉහත යෝජනාව සලකා බලා පලාත් පාලන සතිය නිමිත්තෙන් සිදු කරන වැඩසටහන් පිළිබඳ විධිමත් සැලැස්මක් සභිකවරුන්ගේ දායකත්වයෙන් සකස් කොට ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

31.පළාත් පාලන ආයතන වල ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා කාර්යයසාධනය මත පදනම් වූ ප්‍රාග්ධන ලබා දීම යන මැයෙන් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව ඉහළ කාර්යයසාධනයක් අත්කර ගැනීම හේතුවෙන් රාජ්‍ය පරිපාලන පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මඟින් රු.ලක්ෂ 150ක මුදලක් ලබා දීමට තීරණය කර ඇත.මෙම මුදල ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් සඳහා ලබා දීමට නියමිත බැවින් එම ඉදිකිරීම් මෙම වර්ෂය අවසන් කිරීමට පෙර අවසන් කළ යුතුය.ඒ අනුව කෙටෙතැන්න ගල්උළුවස්සාහේන ඉඩමෙහි හෙළ බොජුන් හළක් ඉදි කිරීමට යෝජනා වී ඇත.අප වෙත අනුමත රු.ලක්ෂ 150ක මුදල හෙළ බොජුන් හළ ඉදිකිරීම වෙනුවෙන් යෙදවීම සම්බන්ධයෙන් සුදුසු තීරණයක් ගැනීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 31**

ඉහත යෝජනාව සලකා බලා පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට ආදායම් උත්පාදන මාර්ගයක් බැවින් කඩිනමින් කෙටෙතැන්න ගල්උළුවස්සාහේන ඉඩමෙහි හෙළ බොජුන් හළක් ඉදිකිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

32.ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය,පනාවැන්න,කහවත්ත පුහුණු මධ්‍යස්ථානයේ කාර්මික (NVQ 4) පරිගණක පාඨමාලාව හදාරා අවසන් කර ඇති මිදිගහමුල්ල,පාතකඩ, පැල්මඩුල්ල ලිපිනයෙහි පදිංචි ජේ.ඒ.පුන්සිසී රස්ප්‍රබා මෙය වෙත අප ආයතනයේ මාස 06ක පරිගණක ක්ෂේත්‍රයේ වැඩිපුර පුහුණු අවස්ථාවක් ලබාගැනීම සඳහා කරනු ලබන ඉල්ලීම හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2017(II) ප්‍රකාරව දිනකට රු.1000.00ක මුදලක් ගෙවීමටත් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා විපක්ෂනායක ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 32**

ඉහත යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

33. පෙරෝණුව වත්ත, රිල්හේන වත්ත පාලුගම්පල කොටසෙහි පවතින අනතුරුදායක බෝගස් දෙක වතු අධිකාරී ඉවත් නොකරන හෙයින් මෙම ගස් ඉවත් කිරීමට මිල ගණන් කැඳවූ අවස්ථාවේ එක් මිල ගණනක් පමණක් ලැබුණි.ඒ අනුව පාලුගම්පල කොටසට රු.500,000.00ක මුදලකුත්, පෙරෝණුව වත්තෙහි ගස සඳහා රු.125,000.00 මුදලකුත් ඉදිරිපත් කර ඇත.ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා සුදුසු තීරණයක් ගැනීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.තිෂෝක් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා විපක්ෂනායක ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසා සිටියේ අනතුරුදායක ගස් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී ගස් සංරක්ෂණය කිරීමේ ක්‍රමවේදයකට යන්න හැකියාවක් පවතීනම් ඒ පිළිබඳ උත්සහයක් දැරීම සුදුසු බවයි.

**තීරණ අංක 33**

ඉහත යෝජනාව සළකා බලා මිල ගණන් කැඳවා ගස් ඉවත් කිරීමටත් වැය වන මුදල වතු අධිකාරියෙන් අය කර ගැනීමට සුදුසු බව ඒකමතිකව සහා සම්මත විය.

II.**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමාගේ යෝජනා**

01.රිටිදොලවත්ත මාර්ගයේ වතුර ගලා යන පරිදී බෝක්කු යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි

02.කහවත්ත බස් නැවතුම්පොළ සහ පොදු වැසිකිළිය ප්‍රතිසංස්කරණය කිරීමට යෝජනා කරමි

03.පළාත් සභා මැතිවරණය පවත්වන ලෙස රජයෙන් ඉල්ලා සිටීම සඳහා යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා විපක්ෂනායක ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා උප සභාපති එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා ප්‍රකාශ කර සිටියේ රිටිදොලවත්ත මාර්ගයේ අවිධිමත් ජනාවාස හේතුවෙන් කාණු පද්ධති අවහිරව කිරීමක් නිසා වැසි කාල වලදී ජනතාව දැඩි අසීරුතාවන්ට පත්වන හෙයින් නිසි සැලැස්මකට අනුව වැසි ජලය බැහැර වීම සඳහා නිසි පරිදී කාණු පද්ධතියක් සකස් කොට හියුම් පයිප්ප 02ක් යෙදීම සුදුසු බවත්,කහවත්ත බස් නැවතුම්පල පිටුපස පිහිටි පොදු වැසිකිළිය ප්‍රතිසංස්කරණය පිළිබඳ අවධානයක් යොමු කිරීමටත්, රේල් වේ ගොඩනැගිල්ල ප්‍රාදේශීය සභාවට ලබා ගැනීමට කටයුතු කිරීමටත්, පළාත් සභා මැතිවරණය පවත්වන ලෙස රජයෙන් ඉල්ලා සිටීම සඳහා කටයුතු කිරීම සුදුසු බවය.

**තීරණ අංක 34**

ඉහත යෝජනාව සම්බන්ධව කාර්මික නිලධාරී ලවා පරීක්ෂණයක් සිදු කර ලැබෙන නිර්දේශ අනුව සභාව හරහා සිදු කළ හැකි සංවර්ධනයන් සිදු කිරීමටත්,එසේ හැකියාවක් නොමැති සංවර්ධනයන් අදාළ ආයතනයන් වෙත යොමු කිරීමත්,පළාත් සභා මැතිවරණය පැවැත්වීම සඳහා සියලුම සභිකවරුන් එක්ව ගරු ආණ්ඩුකාරතුමිය වෙත ඉල්ලීමක් යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**III.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.මොහාන් මංජුල මැතිතුමාගේ යෝජනා.**

01.මාරපන 1 කණුව සිට ගල්ලින්න දක්වා මාර්ගය පිළිසකර කිරීම සඳහා යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම් මංජුල දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.මොහාන් මංජුල මැතිතුමා පවසා සිටියේ මෙම මාර්ගය තැන් දෙකකින් ගිලා බැසීමට ලක්වීම නිසා බස් රථයක් ධාවනය කළ හැකි ආකාරයට සංවර්ධනය කිරීම සුදුසු බවයි.

**තීරණ අංක 35**

ඉහත යෝජනාව සම්බන්ධව කාර්මික නිලධාරී ලවා පරීක්ෂණයක් සිදු කර ලැබෙන නිර්දේශ අනුව සභාව හරහා සිදු කළ හැකි සංවර්ධනයන් සිදු කිරීමටත්,එසේ හැකියාවක් නොමැති සංවර්ධනයන් අදාළ ආයතනයන් වෙත යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**IV.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එච්.ඥානලතා හපුතන්ත්‍රි මැතිතුමියගේ යෝජනා**

01. ඉඩංගොඩ සිට නාරංගොඩ කඩ මණ්ඩිය දක්වා වැටී ඇති මාර්ගය වැලි ඉර සිට බඩහැලගේ වත්ත දක්වා ඇති කොටස ගල් අතුරා කොන්ක්‍රීට් දැමීම සහ එකී මාර්ගය තුල දැනට පවතින හියුම් පයිප්ප ඉවත් කර දිගින් අඩි 15ක් සහ පළලින් අඩි 12ක් පමණ පවතින බෝක්කුව ඉවත්කර කොන්ක්‍රීට් ලැල්ලක් යොදා මාර්ගය සකස් කිරීමට යෝජනා කරමි.

02.හෙළ උඩ සිට නාගහවත්ත හරහා උඩතුලට වැටී ඇති මාර්ගය රංජිත් අබේසිංහ මහතාගේ නිවස අසළ සිට මීටර 800ක් ගල් අතුරා කොන්ක්‍රීට් දැමීම සහ ඉතා අබළන්ව පවතින බෝක්කු 4ට දිගින් 8න් 2කුත්/4න් 2කුත් එහි විශ්කම්භය අඩි2ක් පමණ ඇති හියුම් පයිප්ප 4ක් ලබා ගැනීම සඳහා යෝජනා කරමි.

03. ඉඩංගොඩ සිට ඇල්වත්ත දක්වා ඇති මාර්හය මීටර 300ක් පමණ ප්‍රමාණය ඉතා අබලන්ව ඇති බැවින් එයට ගල් අතුරා කොන්ක්‍රීට් දැමීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම් මංජුල දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 36**

ඉහත යෝජනාව සම්බන්ධව කාර්මික නිලධාරී ලවා පරීක්ෂණයක් සිදු කර ලැබෙන නිර්දේශ අනුව සභාව හරහා සිදු කළ හැකි සංවර්ධනයන් සිදු කිරීමටත්,එසේ හැකියාවක් නොමැති සංවර්ධනයන් අදාළ ආයතනයන් වෙත යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**V.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමාගේ යෝජනා.**

01.මල්වත්ත ගම්මානය හා සිකරදෙණිය කොටස යා කිරීම සඳහා ඇති පාර බැකෝ යන්ත්‍රය යොදා සාදා දීමට යෝජනා කරමි.

02.මාරපන රත්නපුර දක්වා දිවෙන මාර්ගය දෙපස කම්කරුවන් යොදා සුද්ධ කිරීමට යෝජනා කරමි.

03.මල්වතු හේන්යාය මාර්ගය පිළිසකර කිරීමට යෝජනා කරමි.

04.පොත්තකන්ද කොට්ඨාශයේ විදුලි පහන් අලුත්වැඩියා කොට බල්බ් දැමීමට යෝජනා කරමි.

05.ඉහළ හකමුව තුළ පිහිටි ප්‍රධාන පීල්ල අසළ බැකෝ පතල් කැපීම නිසා පීල්ලට එන වතුර පාර නැවතීමට ඉඩ ඇති හෙයින් ඒ පිළිබඳ සොයා බලා නිසි කටයුතු කර දෙන ලෙස යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම් මංජුල දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා පවසා සිටියේ මල්වත්ත ගම්මානය හා සිකරදෙණිය කොටසෙහි මාර්ගය අඩි 20-30ක ප්‍රමාණයක් බැකෝ යන්ත්‍රය යොදා සාදා දීම තුලින් ජනතාවට ගමන් පහසුවක් සැළසෙන බවත්, මල්වතු හේන්යාය මාර්ගය පිළිසකර කිරීමටත්, ප්‍රධාන පීල්ල අවධානමකට ලක්වී ඇති බවත්,පීල්ලට උඩු පැත්තේ ඇති සංරක්ෂණය විය යුතු නාය යාමේ අවධානයක් ඇති ඉඩමක් හෙයින් මෙම ඉඩමේ බැකෝ යන්ත්‍ර යොදා පීල්ල හරස් කොට පතල් සිදු කරන බවයි.එම පීල්ල පිළිබඳ විශේෂ අවධානයක් ලබා දෙන ලෙසයි.

**තීරණ අංක 37**

ඉහත යෝජනාව සම්බන්ධව කාර්මික නිලධාරී ලවා පරීක්ෂණයක් සිදු කර ලැබෙන නිර්දේශ අනුව සභාව හරහා සිදු කළ හැකි සංවර්ධනයන් සිදු කිරීමටත්,එසේ හැකියාවක් නොමැති සංවර්ධනයන් අදාළ ආයතනයන් වෙත යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**VI.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එම්.සුලාරි සඳරේඛා මාකාවිට මැතිතුමියගේ යෝජනා**

01.ගනේගම ගමගෙවත්ත කොටසේ නිවෙස් දෙකක් අතර පවතින කොන්ක්‍රීට් මාර්ගය ගිලා බැස තිබීම නිසා වතුර වලක් පිරී ඇති බැවින් ගමනාගමනයට ඉතා අපහසුය.එම කොටස පිළිසකර කිරීමට යෝජනා කරමි.

02.රිල්හේන වසමට සංවර්ධන නිලධාරී, ග්‍රාම සේවක ,පවුල් සෞඛ්‍ය සේවිකාව,සමෘද්ධි නිලධාරීන් හමුවීමට කාර්යාලයක් සාදා ගැනිමට යෝජනා කරමි.

**03.**මැද්දෙගොඩවත්ත මාර්ගයේ ඉතිරිව ඇති මීටර 30 කොටස ගල් අතුරා කොන්ක්‍රීට් කර දීම හා පිවිසුම් මාර්ගයේ වම් පස මීටර 100කොටසක් සඳහා පැති බැම්මක් යොදා සංවර්ධනය කිරීම යෝජනා කිරීම.

**04.** ගනේගම රිල්හේන අවට මාර්ගයේ විශාල ලෙස අකටයුතුකම් සිදුවන බැවින් අත්‍යවශ්‍ය ස්ථාන වල විදුලි පහන් සවි කිරීම යෝජනා කිරීම.

**05.**ගනේගම උතුර ගම පිහිටා ඇති බහුකාර්යය ගොඩනැගිල්ලට එදිනෙදා පාවිච්චිය සඳහා වැසිකිළි පද්ධතියක් සකස් කර දෙන ලෙස යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම් මංජුල දසනායක මැතිතුමා විසින් ස්ථීර කරන ලදී.

**තීරණ අංක 38**

ඉහත යෝජනාව සම්බන්ධව කාර්මික නිලධාරී ලවා පරීක්ෂණයක් සිදු කර ලැබෙන නිර්දේශ අනුව සභාව හරහා සිදු කළ හැකි සංවර්ධනයන් සිදු කිරීමටත්,එසේ හැකියාවක් නොමැති සංවර්ධනයන් අදාළ ආයතනයන් වෙත යොමු කිරීම සුදුසු බවත්,නව වීථි ලාම්පු සවි කිරීම සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලයේ සබර/රපු/ලී5/වී.ලාම්පු/2023 හා 2023.04.17 දිනැති ලිපියට අනුව නව වීථි පහන් ස්ථාපනය නොකරන ලෙස යොමු කළ ලිපියට අනුව කටයුතු කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**VII.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඉන්දික උදයකුමාර ගුණවර්ධන මැතිතුමාගේ යෝජනා.**

**01.**හකමුව ප්‍රධාන මාර්ගයේ අපද්‍රව්‍ය එකතු කරන ට්‍රැක්ටරය මාසයකට වරක් ලබා දෙන මෙන් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා විසින් ස්ථීර කරන ලදී.

**තීරණ අංක 39**

ඉහත යෝජනාව සළකා බලා සභාවෙහි පවතින ට්‍රැක්ටර් රථ අලුත්වැඩියා කළ යුතු තත්වයේ පවතින බැවින් ට්‍රැක්ටර් රථ අලුත්වැඩියා කිරීමෙන් පසුව ට්‍රැක්ටර් රථයක් හකමුව මාර්ගයේ කසළ එකතු කිරීම සඳහා යෙදවීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**VIII.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමාගේ යෝජනා.**

**01.**වෙල්යායක ගස් ගැලවීම සඳහා බැකෝ යන්ත්‍රය පැය 25ක කාලයක් ලබා ගැනීමට යෝජනා කරමි.

**02.**ප්‍රාදේශිය සභාවේ වාහන සම්බන්ධව අවභාවිතා වීම වැළැක්වීම සඳහා කටයුතු කිරීමට වැඩපිළිවෙලක් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා විසින් ස්ථීර කරන ලදී.

**තීරණ අංක 40**

ඉහත යෝජනාව සළකා බලා කාර්මික නිලධාරී මඟින් ස්ථාන පරීක්ෂාවක් සිදු කර ලැබෙන නිර්දේශ මත සභාවෙහි පවතින බැකෝ යන්ත්‍රය අලුත්වැඩියා කළ යුතු තත්වයේ පවතින බැවින් බැකෝ යන්ත්‍රය අලුත්වැඩියාවෙන් පසුව එම සේවාව ලබා දීමටත්, ප්‍රාදේශිය සභාවේ සියලුම වාහන සම්බන්ධයෙන් විධිමත් සැලැස්මක් සකස් කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**IX.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එෆ්.ජගත් සේනාරත්න මැතිතුමාගේ යෝජනා.**

**01.**නව ගම්මානයේ සිට දිවෙන මාර්ගයේ අවසාන කොටස වන කොල්වින් ජයලත් මහතාගේ නිවස දක්වා ඇති අවසාන කොටස සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**02.**දේවාලෙගම තරුණ සමිතිය සඳහා ප්ලාස්ටික් පුටු 30ක් ලබා දීමට යෝජනා කරමි.

**03.**බෝගොඩ අරඹ ඕවිට කඩේ සිට පාතකඩ පාසල දක්වා ඇති මාර්ගයේ මැද කොටස කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීම.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා විපක්ෂනායක ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා විසින් ස්ථීර කරන ලදී.

**තීරණ අංක 41**

ඉහත යෝජනාව සම්බන්ධව කාර්මික නිලධාරී ලවා පරීක්ෂණයක් සිදු කර ලැබෙන නිර්දේශ අනුව සභාව හරහා සිදු කළ හැකි සංවර්ධනයන් සිදු කිරීමටත්,එසේ හැකියාවක් නොමැති සංවර්ධනයන් අදාළ ආයතනයන් වෙත යොමු කිරීම සුදුසු බවත්,මෙම වර්ෂය සඳහා ද්‍රව්‍යාධාර ලබා දීමට සභාව සතුව ප්‍රතිපාදන නොමැති බැවින් මෙම යෝජනාව පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**X.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එල්.යුරේෂ් පුෂ්පකුමාර මැතිතුමාගේ යෝජනා.**

**01.**කුට්ටපිටි ය වසමේ නො.06,ඉහළ මංසන්ධියේ සිට රෝහිත මහතාගේ නිවස අසළට ඇති ඉතා දුශ්කර මීටර 200පමණ දුර මාර්ගය කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

**02.** කුට්ටපිටිය වසමේ තොටිලගම දමිළ වතුයාය අසළින් ඉහළට දිවෙන නො.03 කොටස යන දුශ්කර මාර්ගය කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.(දුර මීටර 500පමණ) මෙයින් පවුල් 20කට පමණ ප්‍රතිලාභ අත්වේ.නාරංගොඩ සමෘද්ධි පාලම පුළුල් කිරීම.)

**04.** නාරංගොඩ වසමේ දෙහිගහදෙණිය හා මිදලන රිංගානම් ඇල හරහා පාලමක් ඉදිකිරීම සඳහා යෝජනා කරමි.(විශාල ප්‍රමාණයකට ප්‍රතිලාභ අත්වේ.)

**05.**කුට්ටපිටිය වසමේ කිරිවන්දල නො.05 කොටසේ අලුත් ගම්මානය දක්වා ඇති මාර්ගය කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම.(දුර මීටර 250 පමණ)

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී

**තීරණ අංක 42**

ඉහත යෝජනාව සම්බන්ධව කාර්මික නිලධාරී ලවා පරීක්ෂණයක් සිදු කර ලැබෙන නිර්දේශ අනුව සභාව හරහා සිදු කළ හැකි සංවර්ධනයන් සිදු කිරීමටත්,එසේ හැකියාවක් නොමැති සංවර්ධනයන් අදාළ ආයතනයන් වෙත යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**XI.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජෙහන් මෝහන් මැතිතුමාගේ යෝජනා.**

01.පාතකඩ වත්තේ මරණාධාර සමිතියක් අලුතින් ලියාපදිංචි කිරීමට නියමිත බැවින් මරණාධාර සමිතියට අඩි 20ක හඩ් 01ක් හා පුටු 20ක්, කෑම පිසීමේ බඩු භාණ්ඩ ලබා දෙන ලෙස යෝජනා කරමි.

**02.**පාතකඩ කොට්ඨාශයේ ජීවත් වන ජනතාවට නාන තොටු පොළක් තිබෙන බැවින් සියලුම ජනතාව තොටුපොල භාවිතා කරන හෙයින් එම තොටුපොළේ ඇනිකට් එකක් සාදා යකඩ පීල්ලක් දෙකක් සාදා දෙන්නටත්,ජනතාව යන පාරත් අලුත්වැඩියා කර දෙන ලෙස යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා විපක්ෂ නායක ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 43**

මෙම වර්ෂය සඳහා ද්‍රව්‍යාධාර ලබා දීමට සභාව සතුව ප්‍රතිපාදන නොමැති බැවින් මෙම යෝජනාව පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමටත්,සංවර්ධන කටයුත්ත සඳහා කාර්මික නිලධාරී ලවා පරීක්ෂණයක් සිදු කර ලැබෙන නිර්දේශ අනුව සභාව හරහා සිදු කළ හැකි සංවර්ධනයන් සිදු කිරීමටත්,එසේ හැකියාවක් නොමැති සංවර්ධනයන් අදාළ ආයතනයන් වෙත යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**XII.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ධනේෂ් කුමරන් මැතිතුමාගේ යෝජනා.**

**01.**නිලගම නො.03වත්තේ කෝවිලට යන පාර සකස් කිරීමට යෝජනා කරමි.(අඩි 50ක් කොන්ක්‍රීට් දැමීම)

**02.**නිලගම නො.02 වත්තට ක්‍රීඩා පිටියේ සම්පූර්ණ ප්‍රතිසංස්කරණය කිරීම හා ජල ප්‍රවාහන පද්ධතිය සම්පූර්ණයෙන් ප්‍රතිසංස්කරණය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 44.**

ඉහත යෝජනාව සම්බන්ධව කාර්මික නිලධාරී ලවා පරීක්ෂණයක් සිදු කර ලැබෙන නිර්දේශ අනුව සභාව හරහා සිදු කළ හැකි සංවර්ධනයන් සිදු කිරීමටත්,එසේ හැකියාවක් නොමැති සංවර්ධනයන් අදාළ ආයතනයන් වෙත යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**XIII.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.ශ්‍රියානි වීරසේකර මැතිතුමියගේ යෝජනා**

01.බැරැණ්ඩුවේ අක්කර 30 සිට වරාගොඩ හරහා දොඹගස්වින්න මාර්ගය බැකෝ යන්ත්‍රයක් යොදාගෙන මාර්ගයේ පටුතැන් පුළුල් කිරීම සඳහා යෝජනා කරමි.

02.ගොඩගම මිදලන මාර්ගය ආසන්නයේ නිවාස වල අපජලය මාර්ගයේ කාණු පද්ධතියට මුදාහැරීම සම්බන්ධයෙන් සොයා බලා කටයුතු කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඒ.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා විපක්ෂනායක ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසා සිටියේ බැරැණ්ඩුවේ අක්කර 30 සිට වරාගොඩ හරහා දෙනවක දක්වා මාර්ගය දීර්ඝ කර, පාර පළල් කිරීම මඟින් මෙම මාර්ගයට බස් රථයක් යොදවා ජනයාට ගමන් පහසුව සළසා දීමට හැකියාව පවතින බවයි.

**තීරණ අංක 45**

ඉහත යෝජනාව සම්බන්ධව කාර්මික නිලධාරී ලවා පරීක්ෂණයක් සිදු කර ලැබෙන නිර්දේශ අනුව සභාව හරහා සිදු කළ හැකි සංවර්ධනයන් සිදු කිරීමටත්,එසේ හැකියාවක් නොමැති සංවර්ධනයන් අදාළ ආයතනයන් වෙත යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය. ගොඩගම මිදලන මාර්ගය ආසන්නයේ නිවාස වල අපජලය මාර්ගයේ කාණු පද්ධතියට මුදාහැරීම සම්බන්ධයෙන් සොයා බලා කටයුතු කිරීම සම්බන්ධව කාර්මික නිලධාරි ලවා පරීක්ෂණයක් සිදු කර ලැබෙන නිර්දේශ අනුව ඉදිරි කටයුතු කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

XIV.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.මොහාන් මංජුල මැතිතුමා, ඩබ්.එම්.ශ්‍රියානි වීරසේකර මැතිතුමිය, එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා , ඩබ්.ඉන්දික උදයකුමාර ගුණවර්ධන මැතිතුමා විසින් ඉල්ලා ඇති වීථි පහන් අලුත්වැඩියාව සඳහා යෝජනා සුදුසු තීරණයක් ලබා ගැනීමට ගරු සභාවට ඉදිරිපත් කිරීම.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඒ.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 46</u>**

ඉහත යෝජනා සළකා බලා නව වීථි ලාම්පු අලුත්වැඩියා කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීමට නියමිත බැවින් විධිමත් සැලැස්මකට අනුව වීථි ලාම්පු අලුත්වැඩියා කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**වෙනත් කරුණු**

- **සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරීම්**
- **සභාපතිතුමාගේ ස්තුති කිරීම.**

අද දින සභාවට පැමිණ සිටින ගරු විපක්ෂනායකතුමන් ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රී තුමන්ලාට හා මන්ත්‍රී තුමියන්ලාටත් , ලේකම්තුමන් ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාට ස්තුතිය පුද කරමින් ගරු සභාපතිතුමාගේ ස්තුති කතාව අවසන් කරන ලදී.

- ප.ව.1.45ට පමණ සභාවේ කටයුතු අවසන් විය.

ප්‍රාදේශීය සභා .................................................................... මැතිතුමා/මැතිතුමිය ගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා ........................................................................ මැතිතුමා/මැතිතුමිය ගේ ස්ථිරත්වයෙන් සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත විය.

2025-09.11 වන දින
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේදී ය.

සභාපති
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව